සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

51 S I

## පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 13 - 2020

විභාග අංකය .................................. **චිත්‍ර I** කාලය පැය තුනයි

**I පත්‍රය** - කාලය : පැය **03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10 යි.)
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ.
I කොටස - වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **40කි.** ප්‍රශ්න **සියල්ලට** ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් ලකුණු **40කි.**
II කොටස - මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත වේ.
"අ" කොටස - සංස්කෘතික පසුබිම හා රසවින්දනය - ශ්‍රී ලංකාව ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **තුනකි.**
"ආ" කොටස - සංස්කෘතික පසුබිම හා රසවින්දනය - ඉන්දියාව ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **දෙකකි.**
"ඉ" කොටස - සංස්කෘතික පසුබිම හා රසවින්දනය - යුරෝපය ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **දෙකකි.**
"අ" කොටසින් ප්‍රශ්න දෙකක් හා "ආ", "ඉ" යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලකුණු 60 කි.
I පත්‍රයට මුළු ලකුණු ප්‍රමාණය - ලකුණු 100කි.

**II පත්‍රය** - කාලය : පැය **03යි.** මුළු ලකුණු **100කි.**
ද්‍රව්‍ය බලා ඇඳීම සඳහා යොමු කරවන **එක්** ප්‍රශ්නයක් පමණක් ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි.

**III පත්‍රය** - කාලය : පැය **03යි.** මුළු ලකුණු **100කි.**
මෙය "අ", "ආ" හා "ඉ" ලෙස කොටස් තුනකින් සමන්විත වේ.
"අ" කොටස - චිත්‍ර සංරචනය මාතෘකා 04 යි.
"ආ" කොටස - මෝස්තර නිර්මාණය මාතෘකා 03 යි.
"ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ මාතෘකා 03 යි.
මෙම කොටස් තුනෙන් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන එක් වර්ණ චිත්‍රයක් පමණක් නිර්මාණය කළ යුතු වේ.


අවසාන ලකුණු ගණනය කිරීම :


| | | |
|---|---|---|
| I පත්‍රය | = | 100 |
| II පත්‍රය | = | 100 |
| III පත්‍රය | = | 100 |
| අවසාන ලකුණු | = | 300 ÷ 3 = 100 |

**සැලකිය යුතුයි :**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

## I කොටස

◆ ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට **වඩාත් නිවැරදි** පිළිතුර පහත සඳහන් **A, B, C, D, E** ලෙස නම් කර ඇති කැටයම් ඇතුළත් පින්තූර ඇසුරින් තෝරන්න.


A


B


C


D


E



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

01. A අක්ෂරයෙන් දැක්වෙන පොළොන්නරු රාජධානි සමයට අයත් සඳකඩ පහනෙහි දක්නට ලැබෙන සුවිශේෂී නිර්මාණ ලක්ෂණයක් වනුයේ,
1. උද්භිද සැරසිලි මෝස්තර බහුලව අන්තර්ගත කිරීමයි
2. සතුන් පුනරුක්තියෙන් යුතුව නිරූපණය කර තිබීමයි
3. එකකු පසුපස එකකු වශයෙන් සත්වා වලිය දක්වා තිබීමයි
4. සතුන් එක් එක් තීරුවල වෙන් වෙන්ව නිරූපණය කර තිබීමයි
5. පියගැටපෙලට ආබද්ධ වන ස්ථානයේ පළල් තීරුවක් එක්කර තිබීමයි (.......)

02. B අක්ෂරයෙන් දැක්වෙන කැටයම් කොටස උපුටාගන්නා ලද්දේ,
1. ගඩලාදෙණිය විහාරයේ පාදමෙහි කැටයම් අතුරිනි.
2. යාපහුව ද්වාර මණ්ඩපය පාදමේ කැටයම් අතුරිනි.
3. පොළොන්නරුව අංක 1 ශිව දේවාලයේ පිටත බිත්තිවල ඇති විමාන වලිනි.
4. ගඩලාදෙණිය ත්‍රිත්ව ගල් කුලුණෙහි කැටයම් අතරිනි.
5. යාපහුව ද්වාර මණ්ඩපයේ ඇති මකර තොරණ කැටයම් අතුරිනි. (.......)

03. C අක්ෂරයෙන් දැක්වෙන කැටයමින් නිරූපිත කථා වස්තුව වන්නේ,
1. රූ රු මිග ජාතකයයි
2. මහා කපි ජාතකයයි
3. තුරුංග මිග ජාතකයයි
4. ඡද්දන්ත ජාතකයයි
5. සාම ජාතකයයි (.......)

04. D අක්ෂරයෙන් දැක්වෙන ''ජෙරුසෙලම වටලෑම'' නම් ප්‍රසිද්ධ කැටයම දක්නට ලැබෙන ස්ථානය වන්නේ,
1. ටයිටස් ආරුක්කුවෙහිය
2. ට්‍රෝජන් ආරුක්කුවෙහිය
3. කොන්ස්ටන් ටයින් ආරුක්කුවෙහිය
4. ට්‍රෝජන් කුලුණෙහිය
5. මාකස් ඕරුලියස් කුලුණෙහිය (.......)

05. E අක්ෂරයෙන් දැක්වෙනුයේ ඉන්දියාවේ බිහි වූ නව සංස්කෘතියෙහි බෞද්ධ කලාවට අයත් නිර්මාණයකි. ඒ සඳහා,
1. ඉන්දීය පැරණි ස්වදේශීය කලාවේ ආභාෂය ලැබී ඇත.
2. ගුප්ත ආභාෂය ලැබී ඇත.
3. ග්‍රීක රෝම කලාවේ ආභාෂය ලැබී ඇත.
4. ගන්ධාර කලාවේ ආභාෂය ලැබී ඇත.
5. මෞර්ය කලාවේ ආභාෂය ලැබී ඇත. (.......)

- අංක 6 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි** පිළිතුර තෝරන්න.

06. පෙරදිගවාදය (Orientalism) යනු,
1. බටහිර ලේඛනයන්, කවියන්, චිත්‍ර ශිල්පින් පෙරදිග සම්බන්ධයෙන් ගොඩනගන ලද අදහසකි.
2. පෙරදිග කලාව තුළ හමුවන ශෛලියකි
3. අධිරාජ්‍ය වාදයට එරෙහිව පෙරදිග කලාවේ වැදගත්කම ඉස්මතු කල කලා ප්‍රවණතාවකි.
4. බටහිර විද්වතුන් පෙරදිග කලාව හැඳීන්වීමට භාවිතා කල ව්‍යවහාරයකි.
5. අධිරාජ්‍යවාදීන්ගේ බලපෑමට ලක් වූ පෙරදිග කලාවන්හි යලි පිබිදීමකි. (.......)

07. දෙවැදෑරුම් වන ''වයනය'' (Texture) පැවති මූලිකාංගය අතරින් නිර්මාණකරණයේ දී සත්‍ය වයනය සමඟ ගනුදෙනු කරන ශිල්පීන් වන්නේ,
1. චිත්‍ර ශිල්පීන් ය.
2. මුද්‍රණ ශිල්පීන් ය.
3. මූර්ති ශිල්පීන් ය.
4. කාටුන් ශිල්පීන් ය.
5. සන්නිදර්ශන චිත්‍ර ශිල්පීන් ය. (.......)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

08. කිසියම් කලා කෘතියක දෘශ්‍ය මූලිකාංග සමූහය සමස්තයක් ලෙස එකට බැඳී ක්‍රියාත්මක වීම

1. සමබරතාවයයි  2. ඒකීයත්වයයි  3. රිද්මයයි
4. සුසංයෝගයයි  5. පර්යාවලෝකයයි (.......)

09. මහාචාර්ය සේනක බණ්ඩාරනායක විසින්,

1. හින්දු ආභාසය සහිතව මහනුවර චිත්‍ර සම්ප්‍රදාය සංවර්ධනය වූ බව පෙන්වා දෙයි
2. මහනුවර සම්ප්‍රදාය ගැමි ශෛලියක් බව පෙන්වා දෙයි.
3. අනුරාධපුර සම්භාව්‍ය සම්ප්‍රදායේ පරිහානිය මහනුවර සම්ප්‍රදාය මගින් ගම්‍ය වන බව පෙන්වා දෙයි
4. මහනුවර චීන සම්ප්‍රදාය අනුරාධපුර පොළොන්නරු සම්ප්‍රදායේම දිගුවක් බව පෙන්වා දෙයි.
5. මහනුවර සම්ප්‍රදාය ප්‍රාථමික ලක්ෂණ වලින් යුක්ත බව පෙන්වා දෙයි. (.......)

10. ඊජිප්තු වාස්තු විද්‍යාවේ මූලික පදනම ලෙස,

1. වෙළඳාම ඔස්සේ දියුණුවීමෙන් ඇති වූ නාගරිකත්වය පිළිබඳ සංකල්පය ඉවහල් විය.
2. ''රා'' නමින් හඳුන්වන ලද සූර්ය දෙවියා වන්දනය පිළිබඳ සංකල්ප ඉවහල් විය.
3. පාරාවෝ වරුන් ගොඩනගාගත් බලය ඉවහල් විය.
4. පාරාවෝ වරුන්ගේ මරණින් මතු ජීවිතය පිළිබඳ විශ්වාස ඉවහල් විය.
5. දැවැන්ත සංවර්ධනයකට ලක්වූ ගණිතය හා ජ්‍යාමිතිය පිළිබඳ දැනුම ඉවහල් විය. (.......)

◆ අංක 11 සිට 15 තෙක් අසා ඇති ප්‍රශ්න වලට **වඩාත් නිවැරදි** පිළිතුර පහත අංක 1 සිට 8 දක්වා නම් කර ඇති ඡායාරූප ඇසුරින් තෝරන්න.


1


2


3


4


5


6


7


8

11. ආලේඛ්‍ය චිත්‍ර නිර්මාණ වන්නේ,
1. 8,2,1  2. 2,3,7  3. 4,5,6  4. 3,6,7  5. 4,5,7 (.......)

12. නූතනවාදී ලක්ෂණ සහිත සිතුවම් වන්නේ,
1. 1,2,3,5  2. 2,4,6,8  3. 4,5,6,7  4. 1,2,4,5  5. 5,6,7,8 (.......)

13. ආසියාතික කලා ශෛලීන් නිරීක්ෂණය කළ හැකි වන්නේ,
1. 7,8  2. 5,6  3. 2,7  4. 2,6  5. 8,5 (.......)

14. දේවත්වය ආරෝපිත කාන්තා රූප සහිත සිතුවම් ලෙස,
1. 2,4,5  2. 7,6,4  3. 2,6,8  4. 4,6,8  5. 1,7,5 (.......)

15. ද්විමාන ලක්ෂණ ඉස්මතු කළ සිතුවමක් වන්නේ,
1. 1  2. 2  3. 3  4. 5  5. 6 (.......)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

◆ ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට **වඩාත් නිවැරදි** පිළිතුර තෝරන්න.

16. ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලාවෙහි (Academic Realism) මූලික අරමුණක් නොවන්නේ,
   1. ප්‍රශස්ත සෞන්දර්ය රීතියකින් මිනිස් සිරුර නිරූපණය කිරීමයි.
   2. සීමිත වර්ණ මාලාවක් යොදාගනිමින් වර්ණවල මධ්‍යම පැහැය ගොඩනැගීමයි.
   3. පර්යාවලෝකය මූලධර්මය නිවැරදිව භාවිතා කිරීම යි.
   4. බ්‍රිතාන්‍ය රාජකීය ශාස්ත්‍රාලයීය කලාව ආභාෂය කර ගැනීමයි.
   5. නව අත්හදාබැලීම් වල නිරතවීමයි. (.......)

17. විසිවන සියවසේ බිහි වූ පෙරටුගාමී කලා ව්‍යාපාරය වන ඝනිකවාදී කලාව්‍යාපාරයේ වැදගත් ලක්ෂණයක් නම්,
   1. කලාගාරයෙන් බැහැරව එළිමහනට පැමිණ අත්හදා බැලීම් සිදු කිරීමයි.
   2. දෘෂ්‍ය අරමුණු වල ස්වාභාවය ඒ අයුරින්ම අනුකරණය කිරීම වෙනුවට ජ්‍යාමිතික රූප නිරූපණය මගින් ප්‍රකාශනය ප්‍රබලත්වයට පත්කිරීමයි.
   3. ආලෝකය වස්තුවක් මත ඇතිකරන වෙනස ග්‍රහණය කරගෙන ඇඳීමයි.
   4. යම්කිසි දෘෂ්‍ය අරමුණක ස්වාභාවය විකෘති කිරීමෙන් අවශ්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට යොමුවීමයි.
   5. හුදකලා හා විවිධ භාව ප්‍රකාශනයන් මුල් කරගෙන ප්‍රකාශනාත්මකව සිතුවම් කරණයේ නියැලීමයි. (.......)

18. පොළොන්නරු යුගයේ දී ඉදි කරන ලද ප්‍රතිමා ගෘහ නිර්මාණයේ දී දක්නට ලැබෙන විශේෂත්වයක් නම්,
   1. මුළුමනින්ම කැපු කලුගල් කුට්ටි පිරිද්දීමෙන් ඉදිකර තිබීමයි.
   2. කලුගල් පාදමක් මත පොසොලානා බදාමය භාවිතා කර ඉදිකිරීමයි.
   3. ගඩොල් හා හුණු බදාම මාධ්‍යයෙන් ගොඩනගා වහළය සඳහා දැව භාවිතා කිරීමයි.
   4. ගඩොල් මාධ්‍ය කරගෙන ගෙඩිගේ සම්ප්‍රදායට ඉදිකර තිබීමයි.
   5. කලුගල් පාදමක් මත දැව භාවිතයෙන් ඉදිකර තිබීමයි. (.......)

19. 19 වන සියවසේ දී ප්‍රංශයේ බිහි වූ පශ්චාත් උපස්තිථිවාදි කලා ප්‍රවණතාවය බිහිවීම කෙරෙහි පසුබිම් වූයේ,
   1. පැරණි ග්‍රීක රෝම කලාවේ රීතීන් යළි භාවිතා කිරීම කෙරෙහි යොමුවීමේ අවශ්‍යතාවයයි.
   2. පුනර්ජීවන කලාවේ පැවති ස්වාභාවිකවාදය (Naturalism), මානුෂීයවාදය (Humanism) වැනි ප්‍රවේශ අනුගමනය කිරීමයි.
   3. ඒකාකාරීත්වයට පත්වෙමින් පැවති උපස්ථිතිවාදී තේමා හා ශිල්පක්‍රම වලට එදිරි ප්‍රතික්‍රියාවක් ලෙස එහි සීමා අතික්‍රමණය කිරීමේ අරමුණයි.
   4. කලාගාරයෙන් බැහැරවීමේ අවශ්‍යතාවයයි.
   5. නව සමාජ දේශපාලන මතවාදයන්ට එරෙහිව කටයුතු කිරීමයි. (.......)

20. ලංකා කලා සංගමයේ චිත්‍ර ශිල්පීන් ඇතුලත් වරණය නොවන්නේ,
   1. A.C.G.S.අමරසේකර, J.D.A.පෙරේරා, ඩේවිඩ් පේන්ටර්, ටියුඩර් රාජපක්ෂ, ස්ටැන්ලි අබේසිංහ
   2. A.මාර්ක්, K.කනතසභාපති, ජෝර්ජ් කීට්, ඩේවිඩ් ජෙන්ටර්, ඔබ්රි කොලට්
   3. J.D.A.පෙරේරා, A.C.G.S.අමරසේකර, ඩේවිඩ් පේන්ටර්, ටියුඩර් රාජපක්ෂ, A.මාර්ක්
   4. ඔබ්රි කොලට්, ජෝර්ජ් කීට්, J.D.A.පෙරේරා, A.මාර්ක්, ඩේවිඩ් පේන්ටර්
   5. ජෝර්ජ් කීට්, ඔබ්රි කොලට්, A.මාර්ක්, K.කනතසභාපති, ඩේවිඩ් පේන්ටර් (.......)

NWP EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

◆ අංක 21 සිට 25 තෙක් ප්‍රශ්න වලට ඒට ඉදිරියෙන් ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරින් **වඩාත් නිවැරදි** පිළිතුර තෝරන්න.

21. මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය



1. රජ මාළිගාවක නටබුන් ය.
2. නිවාස සංකීර්ණයක නටබුන් ය.
3. නාන තටාකයක නටබුන් ය.
4. දේවස්ථානයක නටබුන්ය.
5. ජල ටැංකියක නටබුන්ය. (.......)

22. මෙහි දක්වා ඇති ගෘහ නිර්මාණ අංගයේ



1. ප්‍රදක්ෂිනා පථ දෙකකින් සමන්විතය.
2. එක් ප්‍රදක්ෂිනා පථයකින් සමන්විතය.
3. ප්‍රදක්ෂිනා පථ නිර්මාණය කර නැත.
4. එක් ප්‍රදක්ෂිනා පථයක පමණක් ගල් ගරාදි වැටක් දැකිය හැක.
5. ප්‍රදක්ෂිනා පථ සඳහා ගල් ගරාදි වැට නිර්මාණය කර නැත. (.......)

23. මෙහි දැක්වෙන ආරාම වාසී භික්ෂූන්ගේ ස්නානය සඳහා භාවිතා කරන ලද ගොඩනැගිල්ල



1. උපෝසථාඝර
2. පධානඝර
3. ආසනඝර
4. ජන්තාඝර
5. බෝධිඝර (.......)

24. මෙහි දැක්වෙන ඊජිප්තියානු වාස්තු විද්‍යාත්මක නිර්මාණය



1. ඉදිකිරීම සඳහා ජ්‍යාමිතික හැඩ බහුල ආකෘතියක් භාවිත කර ඇත.
2. මෙය ඉදිකරවා ඇත්තේ දෙවන රැමේසස් රජු විසිනි.
3. මෙහි ඉදිරිපිට දෙවන රැමේසස් රජුගේ ප්‍රතිමා හතරක් දැකගත හැකිය.
4. රජවරුන් කිහිප දෙනෙක් යටතේ ඉදිකෙරුණු ගෘහ නිර්මාණ අංගයක් වන මෙය දේවස්ථාන හයකින් යුක්තය.
5. මෙය නව රාජධානි සමයේ නයිල් ගඟේ බටහිර නිම්නයේ ඉදිකර ඇති දේවස්ථානයකි. (.......)

25. මෙහි දැක්වෙන කොරින්තියානු කුළුණු යොදාගෙන ඇති දේවස්ථානය




1. ඉරෙක්තියන් ගොඩනැගිලි නමින් හඳුන්වයි.
2. පාතිනොන් දේවස්ථානය නමින් හඳුන්වයි.
3. ඇතන්ස්හි සියුස් දේවස්ථානය නමින් හඳුන්වයි.
4. පොපිලියා දේවස්ථානය නමින් හඳුන්වයි.
5. සාමෝස්හි හේරා දෙවඟනගේ දේවස්ථානය නමින් හඳුන්වයි. (.......)




මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

◆ අංක 26 සිට 30 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** පහත සඳහන් **F, G, H, I, J** ලෙස නම්කර ඇති මූර්ති ඇසුරෙන් තෝරන්න.


F


G


H


I


J

26. F අක්ෂරයෙන් දැක්වෙන ප්‍රතිමාව,
   1. පොළොන්නරු යුගයට අයත් පූර්ණ උන්නත ප්‍රතිමාවකි.
   2. අනුරාධපුර යුගයට අයත් අධි උන්නත ප්‍රතිමාවකි.
   3. පොත්ගුල් විහාරය ඉදිරිපිට අධි උන්නත ප්‍රතිමාවකි.
   4. පරාක්‍රම සමුද්‍රය අසල පිහිටි අර්ධ උන්නත ප්‍රතිමාවකි.
   5. අනුරාධපුර යුගයට අයත් අර්ධ උන්නත ප්‍රතිමාවකි. (.......)

27. G අක්ෂරයෙන් දැක්වෙන කවන්ද රුව
   1. මොහෙන්ජොදාරාවෙන් හමුවී ඇත.
   2. හරප්පාවෙන් හමුවී ඇත.
   3. නයිල් ගඟේ නැගෙනහිර නිම්නයෙන් හමුවී ඇත.
   4. යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා ආශ්‍රිතව හමුවී ඇත.
   5. ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා ආශ්‍රිතව හමුවී ඇත. (.......)

28. H අක්ෂරයෙන් දැක්වෙන ප්‍රතිමාවෙන්
   1. බෝ සතුන් වඩාත් යථාර්තවාදී ස්වරූපයෙන් නිරූපිත ප්‍රතිමාවකි.
   2. ක්ෂය වූ ශරීරය මැනවින් ඉස්මතු කර නැත.
   3. සිවුරේ රැලි ශෛලිගත ලක්ෂණ පෙන්නුම් කරයි.
   4. දුර්වල ත්‍රිමාණ ලක්ෂණ පෙන්නුම් කරයි.
   5. විචිත්‍රවත් ප්‍රභා මණ්ඩලයක් සහිතය. (.......)

29. I අක්ෂරයෙන් දැක්වෙන ප්‍රතිමාවෙන්,
   1. නෙෆර්ටිටි රැජින හා රජු දැක්වේ.
   2. නාමර් රජු හා බිරිය දැක්වේ.
   3. මෙන්කුරේ රජු සහ ඔහුගේ බිරිය දැක්වේ.
   4. කුරෝස් සහ කෝරේ දැක්වේ.
   5. ස්ක්‍රයිබ් දැක්වේ. (.......)


30. J අක්ෂරයෙන් දැක්වෙන මියයන ගෝල් වරයා ප්‍රතිමාවෙන්
   1. ග්‍රීක සම්භාව්‍ය අවධිය, පැරණි ආකේන යුගයෙන් වෙනස්වන ලක්ෂණ සහිතය.
   2. ග්‍රීක හෙලනිස්ටික් යුගය සම්භාව්‍ය යුගයෙන් වෙනස්වන ලක්ෂණ සහිතය.
   3. ග්‍රීක පැරණි යුගය හෙලනිස්ටික් යුගයෙන් වෙනස්වන ලක්ෂණ සහිතය.
   4. ග්‍රීක මධ්‍යකාලීන යුගය පැරණි යුගයෙන් වෙනස්වන ලක්ෂණ සහිතය.
   5. මධ්‍යකාලීන යුගය පුනරුද යුගයෙන් වෙනස්වන ලක්ෂණ සහිතය. (.......)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NIE - EXAM

◆ අංක 31 සිට 35 දක්වා අසා ඇති ප්‍රශ්නවලට **වඩාත් නිවැරදි** පිළිතුර **K, L, M, N, O** ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරින් තෝරන්න.


**K**


**L**


**M**


**N**


**O**

31. K අක්ෂරයෙන් දැක්වෙන සෝමබන්දු විද්‍යාපති විසින් අඳින ලද සරණ මංගල්‍ය නම් සිතුවමේ,
   1. සම්ප්‍රදායික බෞද්ධ කලා ලක්ෂණ හඳුනාගත හැකිය.
   2. ස්වාභාවික වාදී ලක්ෂණ බෞද්ධ කලාවට හඳුන්වා දී ඇත.
   3. සනිකවාදී හැඩතල භාවිතා කොට ඇත.
   4. නූතන බෞද්ධ කලා ලක්ෂණ හඳුනාගත හැකිය.
   5. පෙරදිග සම්භාව්‍ය ශෛලිය අනුගමනය කොට ඇත. (.......)

32. L අක්ෂරයෙන් දැක්වෙන ජෝර්ජස් බ්‍රාක් ගේ සිතුවමේ ඒකවාර්ණික බවින්
   1. ඕනෑම වර්ණයක ප්‍රභේද ගණනාවක් ඇති බව පෙන්වා දේ.
   2. රේඛාව හා හැඩතල වල ප්‍රකාශනයට මූලිකත්වය ලබා දී ඇත.
   3. උපස්ථිතිවාදී වර්ණ භාවිතය අභියෝගයට ලක් කොට ඇත.
   4. වර්ණ චිත්‍රයකට අනවශ්‍ය මූලිකාංගයක් බව පෙන්වා දී ඇත.
   5. සංගත බව තුලින් මතුවන චමත්කාරය විදහා දක්වා ඇත. (.......)

33. M අක්ෂරයෙන් දැක්වෙන නන්දලාල් බෝස් ගේ සිතුවමෙන්
   1. අජන්තා, එල්ලෝරා සම්ප්‍රදායවල ආභාසය පෙන්නුම් කෙරේ.
   2. ඉන්දීය මෝගල් කලාවේ ආභාෂය ප්‍රකට වේ.
   3. ඔහුගේ ගුරුවරයා වූ අබනින්ද්‍රානාත් තාගෝර් ගේ ආභාසය හඳුනාගත හැක.
   4. ඉන්දියානු ජන කලාවන්හි ආභාසය හඳුනාගත හැකිය.
   5. යුරෝපීය යථාර්ථවාදී කලාවන්හි ආභාසය පෙන්නුම් කෙරේ. (.......)

34. N අක්ෂරයෙන් දැක්වෙන අජන්තාවේ අංක 17 ලෙනෙහි ඇඳ ඇති සීහලාවදානය නැමති සිතුවමෙන්,
   1. යුධ ජයග්‍රහණයක් නිරූපණය වේ.
   2. ශ්‍රී ලංකාවට විජය රජුගේ ආගමනය නිරූපණය වේ.
   3. රාම විසින් ලංකාද්වීපය ආක්‍රමණය නිරූපණය වේ.
   4. ගුප්ත යුගයේ ලංකාවට එල්ල වූ ඉන්දීය ආක්‍රමණයක් නිරූපණය වේ.
   5. හින්දු සාහිත්‍යයේ එන සුර අසුර යුද්ධය නිරූපණය වේ. (.......)


35. O අක්ෂරයෙන් දැක්වෙන රාෆායෙල් ගේ පර්නාසන් නම් සිතුවම මගින්
   1. පුනරුද සමයේ කාව්‍ය ශාස්ත්‍රය හා චිත්‍ර කලාව අතර පැවති සබඳතාව නිරූපණය වේ.
   2. කාව්‍ය ශාස්ත්‍රයේ වැදගත්කම අවධාරණය වේ.
   3. කාව්‍ය මගින් ගොඩනගන සෞන්දර්යාත්මක මනහර ලෝකය නිරූපණය වේ.
   4. ග්‍රීක රෝම කලා මූලයන් පුනරුද සමයේ නැවත ඉස්මතු වන ආකාරය හඳුනාගත හැකිය.
   5. කාව්‍ය හා චිත්‍රය හා බැඳුණු දාර්ශනික හරයන් මතුකර දක්වයි. (.......)

NWP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

◆ අංක 36 සිට 40 දක්වා ප්‍රශ්න වලට **වඩාත් නිවැරදි** පිළිතුර පහත සඳහන් චිත්‍රය ඇසුරින් තෝරන්න.



36. මෙම සිතුවම ඇඳි ශිල්පියා වන්නේ,
1. පෝල් ගොගැන් ය.
2. පෝල් සෙසාන් ය.
3. එඩ්ගා ඩෙගාස් ය.
4. ක්ලෝඩ් මොනේ ය.
5. වින්සන්ට් වැන්ගෝ ය. (.......)

37. මෙම සිතුවමින් නිරූපණය වන්නේ,
1. උපත මරණය හා ඒ දෙකට ඔබ්බෙහි වන පැවැත්ම පිළිබඳ ශිල්පියාගේ සිතුවිලි දාමයයි.
2. ක්‍රිස්තුස් වහන්සේ කිතුණු ජනතාවගේ පරම මග පෙන්වා දෙන්නාය යන යහපත් එඬේරා සංකල්පයයි.
3. ශිල්පියා සතු ආගමික බැතිය හා ශිල්පියාගේ අභ්‍යන්තර සංවේදීභාවයන්ය.
4. ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ කිතුනු බැතිමතුන්ගේ ගෞරවනීය හැඟීමයි.
5. කුරුසියේ ඇණගසන ලද ජේසුස්වහන්සේ හා කලාකරුවාගේ අභ්‍යන්තර සිතුවිලි සමුදායයි. (.......)

38. මෙම සිතුවමින් හඳුනාගත හැකි චිත්‍ර ශෛලිය වන්නේ,
1. උපස්ථිතිවාදී ශෛලියයි.
2. ඝනිකවාදී ශෛලියයි
3. පශ්චාත් උපස්ථිතිවාදී ශෛලියයි.
4. ව්‍යුක්ත ප්‍රකාශනවාදී ශෛලියයි
5. අධිතාත්වික වාදී ශෛලියයි (.......)

39. මෙම සිතුවමෙහි වර්ණ භාවිතයේ සුවිශේෂි ශිල්පීය ලක්ෂණයක් වන්නේ,
1. දීප්තිමත් වර්ණ භාවිතයෙන් ගොඩනැගෙන ත්‍රිමාණ ලක්ෂණ දැක්වීමයි.
2. ශාස්ත්‍රාලයීය කලාවේ ත්‍රිමාණ ලක්ෂණ බැහැර කළ පැතලි වර්ණාලේපය හා තද කළු බාහිර රේඛා භාවිතයයි.
3. වර්ණ පදාස දැක්වෙන පරිදි වේගවත් ඝන පින්සල් පහර අඛණ්ඩව යෙදීමයි.
4. අඳුර තුළින් ආලෝකය මතුවන සේ වර්ණ ගැන්වීමේ ශාස්ත්‍රාලීය ශිල්ප ක්‍රමවේදය අනුගමනය කිරීමයි.
5. වර්ණයක මධ්‍යම පැහැය සියුම් ලෙස මතුකර දැක්වීමේ සාධුගමන ප්‍රයෝගය භාවිතා කිරීමයි. (.......)

40. මෙම ශිල්පියාගේ නිර්මාණ ලක්ෂණ ගොඩනැගීම සඳහා බලපාන ලද්දේ,
1. පුනර්ජීවන සමයේදී අවධානයට ලක්කරන ලද මානව වාදය, පුද්ගල වාදය, ස්වාභාවික වාදයේ බලපෑමයි.
2. පැරණි ග්‍රීක රෝම සම්භාව්‍ය කලාවේ නීති රීතින් හා පරමාදර්ශීභාවයයි.
3. යුරෝපීය ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලාවේ මූලයන් ය.
4. රොමෑන්තිකවාදී හා පෙරදිගවාදී අදහස්ය.
5. ශාස්ත්‍රාලයීය කලාවේ මූලයන්ගෙන් බැහැර වූ ප්‍රාකෘතික කලා, ජන කලා හා මධ්‍යකාලීන වර්ණ සිතුවම් ආදී මූලයන් ය. (.......)

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

# 13 ශ්‍රේණිය - චිත්‍ර I

## II කොටස

- මෙම කොටස් අනු කොටස් තුනකින් සමන්විතය.
- ''අ'' කොටසින් ප්‍රශ්න දෙකක් හා ''ආ'' ''ඉ'' යන කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
(අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ)

## 'අ' කොටස

## සංස්කෘතික පසුබිම හා රසාස්වාදය

### ශ්‍රී ලංකාව

01. නූතන බෞද්ධ විහාර බිතු සිතුවම් කරණයේ නව නිර්මාණ ශෛලියක් ඇති කිරීමට හැකි වූ චිත්‍ර ශිල්පියෙකු ලෙස සෝලියස් මෙන්ඩිස් ශිල්පියා හැඳින්විය හැකිය.

   i. සුප්‍රසිද්ධ කැළණි විහාරය හැරුණු කොට, සෝලියස් මෙන්ඩිස් කලා ශිල්පියා විසින් සිතුවම් අඳින ලද විහාර දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

   ii. නූතන විහාර බිතු සිතුවම් කලාව පිළිබඳ අධ්‍යයනය කිරීමේදී බෙල්ලන්විල පුරාණ රජ මහා විහාරයට සුවිශේෂ වැදගත්කමක් හිමි වේ. එහි බිතු සිතුවම් අඳින ලද ශිල්පියා නම් කර එම චිත්‍රවල සුවිශේෂ ලක්ෂණ කෙටියෙන් දක්වන්න. (ලකුණු 05 යි)

   iii. බෙල්ලන්විල රජ මහා විහාරය හා සුප්‍රසිද්ධ කැළණි විහාරයේ බිතු සිතුවම් පිළිබඳව සන්සන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

02. ශ්‍රී ලංකාවේ මුල් කාලීනව තනන ලද ස්ථූප පිළිබඳව අනාවරණය කරගත හැක්කේ, ථූප වංශය හා මහා වංශයෙනි. එමෙන්ම 'වෛජයන්ත' නම් ග්‍රන්ථයේ ස්තූප තැනීමේ ආකාර හයක් පෙන්වා දී ඇත. ස්තූප ගර්භයේ හැඩය අනුව එසේ වර්ග කර ඇත.

   i. ශ්‍රී ලංකාවේ විහාරාරාම වල වැඩි වශයෙන් දැකිය හැකි ස්ථූප හැඩ දෙක නම් කරන්න. (ලකුණු 02 යි)

   ii. අටමස්ථාන අතර වැදගත්ම පූජනීය ස්ථානයක් ලෙස සැලකෙන 'ථූපාරාම' ස්තූපය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි)

   iii. ශ්‍රී ලංකාවේ ස්ථූප ආශ්‍රිත කලා නිර්මාණ අතර ඇති වාහල්කඩ නම් වූ නිර්මාණ අංගය, අනුරාධපුර යුගයේදී ස්තූපයට එක් වූ නවතම උපාංගයකි. වාහල්කඩ නිර්මාණය හා එහි කලාත්මත අංග පිළිබඳ අගයමින් එම නිර්මාණ පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 08 යි)

03. පොලොන්නරු යුගයේ වාස්තු විද්‍යා නිර්මාණ අතර, වැඩි වශයෙන් ඇත්තේ බෞද්ධාගමික ගොඩනැගිලිය.

   i. සංවිධානගතව ගොඩනගන ලද පොළොන්නරු නගර සැලැස්මෙහි වූ බෞද්ධාගමික ගොඩනැගිලි දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

   ii. ''ගිංජිකාවසථ'' නම් පාලි වචනයෙන් හඳුන්වන ගෙඩිගෙය නම් වූ ප්‍රතිමාඝර වර්ගය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05 යි)

   iii. ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැගිලි අතරින්, ආගමික නොවන ගොඩනැගිලි වලට සාධක හමුවන්නේ අල්ප වශයෙනි. 11 වන හා 12 වන සියවස් වලට අයත් වන මාළිගා හා රාජ මණ්ඩප කීපයක නටබුන් ඉතිරිව ඇත. ඒ අතරින් රමණීය වූ රාජ මාලිගයක් ව පැවති. පරාක්‍රමබාහු රජ මාළිගයේ ගෘහ නිර්මාණ අංග පිළිබඳ විමසීමක් කරන්න (ලකුණු 08 යි)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## 'ආ' කොටස

## සංස්කෘතික පසුබිම හා රසාස්වාදය

### ඉන්දියාව

04. පල්ලව කලා සම්ප්‍රදාය දකුණු ඉන්දීය කලා සම්ප්‍රදායකි. මෙම කලා සම්ප්‍රදාය ක්‍රි.ව.4 වැනි සියවසේ සිට 9 වැනි සියවස තෙක් ක්‍රියත්මක වූවකි.

i. පල්ලව වාස්තු විද්‍යාව ප්‍රධාන කොටස් දෙකක් යටතේ දක්වා ඇත. එම කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02 යි)

ii. තනිකළු ගලින් නිම කරන ලද 'පංච පාණ්ඩව රථ' නම් ගොඩනැගිලි විශේෂය පල්ලව වාස්තු විද්‍යාවේ මුල් කාලීන ලක්ෂණ පෙන්නුම් කරයි. මේවා අතරින් 'ධර්මරාජ රථය' පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි)

iii. පල්ලව අවධියේ ගොඩ නගන ලද ඉතාම සිත් ගන්නා සුළු මූර්තිමය සංරචනයක් වන ''ආකාශ ගංගාවරෝහණ'' යෙහි මානව රූප හා සත්ව රූප සංරචනය, ශෛලිය හා එහි අර්ථ කථන දක්වමින් කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

05. ලෝක උරුමයක් ලෙස නම් කර ඇති අජන්තාව භාරතයේ විශිෂ්ට වූ මහා කලාගාරයකි. මෙහි ඇති වැදගත්ම කලා අංගය අජන්තා සිතුවම්ය. සුවිසල් කඳු පර්වතයක් ඇතුලට හාරා නිම කරන ලද ලෙන් කීපයක චිත්‍ර ඇඳ ඇත.

i. අජන්තාවේ අංක 16 හා 17 ගුහා තුළ විශිෂ්ට සිතුවම් පෙළක් දැකිය හැකි වේ. ඉන් 17 ගුහාවේ සිතුවම් කර ඇති ජාතක කතා 2ක් නම් කරන්න. (ලකුණු 02 යි)

ii. ඉන්දියානු කලාවේ ස්වර්ණමය යුගය ලෙසට සැලකෙන ගුප්ත යුගයේ ඉදි වූ අජන්තා ලෙන් මගින් වාස්තු විද්‍යාවේ විශිෂ්ට ලක්ෂණ පෙන්වන බව විචාරක මතයයි. අජන්තා ලෙන් විහාර කර්මාන්තය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි)

iii. අජන්තා සිතුවම් වල විශිෂ්ටත්වය, වර්ණ හා රේඛා හැසිරවීම, හැඩතල සමපිණ්ඩනය, හැඟීම් ප්‍රකාශනය ආදිය දක්වමින් අජන්තා චිත්‍ර වල ඇති උසස් කලා ලක්ෂණ පිළිබඳ උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 08 යි)

## 'ඉ' කොටස

## සංස්කෘතික පසුබිම හා රසාස්වාදය

### යුරෝපය

06. උපස්ථිතිවාදය 19 වැනි සියවස මැද ප්‍රංශයේ පැරිස් නගරය මූලිකව ගොඩ නැගුණු චිත්‍ර කලා ව්‍යාපාරයකි. උපස්ථිතිවාදී ශිල්පීහු තම නිර්මාණ ප්‍රදර්ශනය කිරීමේ අරමුණු මත එකතු වූ නිදහස් සංවිධානයක් ලෙස හැඳීන්විය හැකිය.

i. උපස්ථිතිවාදී ශිල්පිනියක් වන මේරි කසාට් ගේ නිර්මාණ දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

ii. උපස්ථිතිවාදීන්ගේ කලා ප්‍රවේශ මුළුමනින්ම පුනරුද සහ ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලා ශෛලි ප්‍රයෝග වලට අයත් වූ ඒවාය. එම කලාත්මක ප්‍රවේශ හඳුන්වන්න. (ලකුණු 05 යි)

iii. ක්ලෝඩ් මොනේ ගේ චිත්‍රවල ස්වාභාවික වර්ණ ආලෝකයේ දී විවිධ වෙනස්වීම් වලට භාජනය වීම, වස්තු මත ආලෝකය ක්‍රියාත්මක වන ආකාරය දැක්වීම සම්භාව්‍ය ක්‍රමය වෙනස්වන ලෙස යොදා ගැනීම ආදී වශයෙන් විග්‍රහ වී ඇත. මෙම තත්වය ඔහුගේ සිතුවම් වලින් කොතෙක් දුරට පැහැදිලිවේදැයි උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 08 යි)

07. ක්‍රි.පූ.1100 දී පමණ ගොඩනැගෙන ග්‍රීක ශිෂ්ටාචාරය නූතන බටහිර සංස්කෘතියට පදනම දමමින් විද්‍යාව හා කලාව යන අංශ දෙකටම විශිෂ්ට දායකත්වයක් සපයා ඇත.

i. ග්‍රීක ගොඩනැගිලි අතර සම්භාව්‍ය අවධියේ නිර්මාණය වූ ''පාතිනොන්'' දේවස්ථානය ඇතීනා දෙවඟන වෙනුවෙන් ඉදිකර ඇතැයි සැලකේ. මෙම දේවස්ථානය ඉදි කළ ගෘහ නිර්මාණ ශිල්පීන් දෙදෙනා නම් කරන්න. (ලකුණු 02 යි)

ii. ග්‍රීක මැටි බඳුන් උපයෝගිතා අගයෙන් හා කලාත්මක අතින්ද උසස් මට්ටමක විය. ග්‍රීක මැටි බඳුන් කලාව පිළිබඳ සැකෙවින් විමසන්න. (ලකුණු 05 යි)

iii. ග්‍රීක සම්භාව්‍ය යුගයට අයත් මූර්ති නිර්මාණ වල රිද්මයානුකූල ඉරියව් දැක්වීම, දේව සංකල්ප මනුෂ්‍ය රූපාකාරයෙන් දැක්වීම හා ඒවායේ විශිෂ්ටත්වය පිළිබඳ එම නිර්මාණ කරන ලද ශිල්පීන්ගේ කලා කෘති ඇසුරෙන් විමසන්න. (ලකුණු 08 යි

NWP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

51 S II

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

First Term Test - Grade 13 - 2020

විභාග අංකය ..................................

# චිත්‍ර II

කාලය පැය තුනයි

**අයදුම්කරුවන්ට උපදෙස්**

- ඔබේ නම/විභාග අංකය ඔබ චිත්‍රය අඳින කඩදාසියේ පසුපිටේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය වියළී තිබීම වැදගත්ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින්, එය ඔබට අවාසි විය හැකිය.

මාධ්‍යය :-

දියසායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් හෝ මෙම මාධ්‍ය මිශ්‍රිතව හෝ භාවිත කිරීමට නිදහස ඇත.

## ස්වාභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය.

- පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති පැලෑටිය සහිත ද්‍රව්‍ය සමූහය ඇඳ වර්ණ කරන්න.
- කඩදාසි තලය, අර්ථවත්ව භාවිතා කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.
- ද්‍රව්‍යවල හා පැලෑටියේ ගති ලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස් මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාලෝක රීති පිළිබඳව සැලකිලිමත් වන්න.
- ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න.
- වර්ණ මාධ්‍ය හැසිරවීමේ ශිල්ප ක්‍රම අර්ථවත්ව භාවිතා කරන්න.
- ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැලපෙන පරිදි වෙනස් කර ගැනීමට හැකිය.
- දියසායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් හෝ මෙම මාධ්‍යය මිශ්‍රිතව හෝ භාවිතා කළ හැකිය.

**අභිමතාර්ථ :-**

1. ස්වභාවික හා නිර්මිත වස්තුන්ගේ ස්වභාවය හා හැඩය තේරුම් ගැනීමේ හැකියාව සිද්ධාන්ත භාවිතය පිළිබඳ කුසලතාවය හා ක්‍රම ශිල්ප භාවිතය මැන බැලීම.
2. රේඛා මාධ්‍ය භාවිතයෙන් වස්තුන්ගේ ගති ලක්ෂණ නිරූපණය වනසේ ප්‍රකාශ කිරීමේ හැකියාව හා සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මැන බැලීම.
3. වර්ණ භාවිතා කිරීමේ ක්‍රම ශිල්ප හා වස්තුන්ගේ ගති ලක්ෂණ මතුවන සේ වර්ණ භාවිතය පිළිබඳ හැකියාව මැන බැලීම.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

51 | S | III

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 - 2020**

විභාග අංකය ..................................

# චිත්‍ර III

කාලය පැය තුනයි

උපදෙස් :-

- පහත සඳහන් 'අ', 'ආ' සහ 'ඉ' කොටස් තුනෙන් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.
- ඔබේ විභාග අංකය හා තෝරාගත් ප්‍රශ්න අංකය ඔබ චිත්‍ර අඳින කඩදාසියේ පසුපිටේ පැහැදිලි ව ලියන්න.
- චිත්‍රය භාර දෙන විට එය වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින් එය ඔබට අවාසි විය හැකිය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල්, කුඩු සායම් යන මාධ්‍ය හෝ එම මාධ්‍ය මිශ්‍රිතව භාවිතා කිරීමට නිදහස ඇත.

## "අ" - කොටස - චිත්‍ර සංරචනය

01. ''ආගමික උත්සව අවස්ථාවක්'' තේමාවට අනුව චිත්‍රයක් නිර්මාණය කරන්න.
02. අස්වනු නෙළන ගොවි ගෙවිලියෝ
03. කුඹුක් ගස ළඟ ගමේ නාන තොටුපල
04. විවාහ මංගල උත්සව අවස්ථාවක් ශෛලිගත සම්ප්‍රදායට අනුව චිත්‍රණය කරන්න.

## 'ආ' - මෝස්තර නිර්මාණය

01. තරුණියන් සඳහා උචිත නවීන විලාසිතාවේ ගවුම් මැසීම සඳහා සුදුසු මුද්‍රිත රෙද්දකට උචිත ව්‍යාප්ත මෝස්තරයක් මල්, කොළ හා ගෙඩි ඇසුරින් නිර්මාණය කර වර්ණ කරන්න.
02. විද්‍යාලයීය පෙරදිග තූර්ය වාදක කණ්ඩායම සඳහා ඇඳුම් විලාසිතාවක් නිර්මාණය කොට ඊට ගැළපෙන වර්ණ යොදා අභිමත පරිදි වර්ණ ගන්වන්න.
03. පාරම්පරික සිංහල සැරසිලි මෝස්තර අතර එන ''හංස පූට්ටුව'' මෝස්තර ඒකකය යොදා ගනිමින් ගෙල පළඳින තැල්ලක් සඳහා සුදුසු සැලසුමක් නිර්මාණය කොට නිර්මාණය කිරීමට අපේක්ෂිත මාධ්‍යයේ ලක්ෂණ පෙනෙන පරිදි වර්ණ ගන්වන්න.

## 'ඉ' - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

01. සීඝ්‍ර ලෙස පැතිරී යන කොවිඩ්-19 වසංගතයෙන් ආරක්ෂා වීම සඳහා මහජනයා දැනුවත් කෙරෙන පෝස්ටරයක්, සුදුසු වැකිද භාවිතා කරමින් නිර්මාණය කරන්න.
02. 'නව පද්‍ය සංකල්පනා' නමින් නිර්මාණ කෘතියක් සඳහා පිටකවරයක් අක්ෂර හා රූප සටහන් සහිතව සිත්තම් කරන්න.
03. විද්‍යාලයීය නව නිපැයුම් සංගමය සඳහා උචිත ලාංඡනයක් නිර්මාණය කර වර්ණ ගන්වන්න.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

## පළමු වාර පරීක්ෂණය 2020 චිත්‍ර කලාව II පත්‍රය - ආදර්ශ චිත්‍ර සටහන
## முதலாம் தவணைப் பரீட்சை – 2019 சித்திரக்கலை – பகுதி II – மாதிரி பத்திரம்
## 13 ශ්‍රේණිය – தரம் 13

**ශාලාධිපතිට උපදෙස්**


❖ පහත යෝජිත ද්‍රව්‍ය යොදාගෙන ද්‍රව්‍ය සැලැස්මට අනුව ද්‍රව්‍ය ඇටවුම සකස් කරන්න.

**යෝජිත ද්‍රව්‍ය :-** සුදු කඩදාසියකින් ආවරණය කරන ලද හිස් කාඩ්බෝඩ් පෙට්ටියක් (මාරි පෙට්ටියක්)
වර්ණවත් පත්‍ර සහිත ක්‍රෝටන් අත්තක් (පත්‍ර 5-6 පමණ)
අඩක් ජලය පුරවන ලද වීදුරු බෝතලයක්
ප්ලාස්ටික් කෝප්පයක් (අඟල් 6 ක් පමණ උස)
ඉරි හෝ කොටු සහිත නැප්කින් එකක් (රෙදි කඩක්)
පිරිසියක්
$^1/_3$ ක කොටසක් ඉවත් කරන ලද කොමඩු ගෙඩියක්
ද්‍රව්‍ය තැබීමට ආධාරකයක් (ඩ්‍රෝවින් බෝඩ්)

**மேற்பார்வையாளருக்குரியது.** : படத்திலுள்ளவாறு பொருட்களை ஒழுங்குப்படுத்திக் கொள்க.

**தேவைப்படுபவை :**

1. காட்போட் பெட்டியொன்று (மாரிபிஸ்கட் பெட்டி) வெள்ளை கடதாசியால் சுற்றப்பட்டது
2. வர்ண குரோட்டன் கிளையொன்று (5 – 6) இலைகளுடன் கூடியது
3. அரைவாசி நீர் நிறைத்த கண்ணாடி போத்தலொன்று
4. பிளாஸ்டிக் கோப்பை ( 6 அங்குல உயரமானது)
5. சதுரம் அல்லது கோடுகளை கொண்ட துணித்துண்டு
6. பீரிஸ் ஒன்று
7. 1/3 துண்டு வெட்டப்பட்ட முழாம்பழம் (பாணி பூசணி)
   ஆதாரப் பலகையொன்று





මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**පළමු වාර පරීක්ෂණය - 2020 - 13 ශ්‍රේණිය**

**චිත්‍ර කලාව I**

**පිළිතුරු පත්‍රය**

**I කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **1.** | 4 | **11.** | 5 | **21.** | 3 | **31.** | 4 |
| **2.** | 5 | **12.** | 1 | **22.** | 1 | **32.** | 2 |
| **3.** | 2 | **13.** | 4 | **23.** | 4 | **33.** | 1 |
| **4.** | 1 | **14.** | 3 | **24.** | 4 | **34.** | 2 |
| **5.** | 3 | **15.** | 3 | **25.** | 3 | **35.** | 4 |
| **6.** | 1 | **16.** | 5 | **26.** | 3 | **36.** | 1 |
| **7.** | 3 | **17.** | 2 | **27.** | 2 | **37.** | 5 |
| **8.** | 2 | **18.** | 4 | **28.** | 1 | **38.** | 3 |
| **9.** | 4 | **19.** | 3 | **29.** | 3 | **39.** | 2 |
| **10.** | 4 | **20.** | 1 | **30.** | 2 | **40.** | 5 |

**චිත්‍ර කලාව I පත්‍රය**
**I කොටස 1 x 40 = 40**
**II කොටස 60 = 60 = 100**

**I පත්‍රය සඳහා** = ලකුණු 100
**II පත්‍රය** = ලකුණු 100
**III පත්‍රය** = ලකුණු 100 = 300/3

**II - පත්‍රය සඳහා පිළිතුරු**

'අ' කොටස - ලංකා කලා ඉතිහාසය

01. (i) රණස්ගල්ල විහාරය, ගිරිඋල්ල මැද්දෙපොල විහාරය, හබාරාදුවේ පිටිදූව කැළණිගොඩ විහාරය, පොළොන්නරු ශ්‍රී විජය විහාරය.

(ii) සෝම බන්දු විද්‍යාපති
බෙල්ලන්විල සිතුවම් නිර්මාණ සම්ප්‍රධාය සඳහා පාදක කොට ගෙන ඇත්තේ පෙර අපර දෙදිග කලා සම්ප්‍රදායන්ය.
**<u>සුවිශේෂ ලක්ෂණ</u>**
* රිද්මයානුගත සිහින් දිගටි හැඩ
* මානව රූප නිරූපණයේ දී ශරීරයේ මාංශ පේශි උලුප්පා නොදැක්වීම.
* අවස්ථාවට හා හැඟීම් නිරූපණයට අනුව රිද්මානුකූල චලනයන් දැක්වීම හා භරත හා කථකළී සම්ප්‍රදායවල ආභාසය පෙන්නුම් කිරීම.
* රිද්මයානුකූල රේඛා, සම්භාව්‍ය වර්ණ භාවිතය, සීමිත වර්ණ පරාසයක් තුළ චිත්‍ර නිර්මාණය කිරීම.
* තලය මත මනා සම්පිණ්ඩනය
* සිද්ධි නිරූපණයේ දී ස්වාභාවිකවාදී මාවතෙන් ඈත්වීම.
* එළිය අඳුර හා ත්‍රිමාණ ලක්ෂණ දැක්වීම.
* චිත්‍ර සැරසිලිකරණය, විවිධත්වයෙන් යුතු වස්ත්‍රාභරණ නිරූපණය.
* සමහර අවස්ථාවල ස්ත්‍රී රූප වල උඩුකය වස්ත්‍ර රහිතව හා සමහර අවස්ථාවල ඇඟට ඇලුණු ස්වාභවය දැක්වීම.
* පුරුෂ රූප බොහෝ විට යටිකය පමණක් ආවරණය කර ඇති අතර සමහර අවස්ථාවලදී දෙවුර වැසූ සාටකයක් සහිතව ද නිරූපණය කර ඇත.

(iii) නූතන බෞද්ධ විහාර බිතුසිතුවම්කරණයේ නව නිර්මාණ ශෛලියක් ඇති කිරීමට සෝලියස් මෙන්ඩිස් ශිල්පියාට හැකි විය. වස්තු විෂයද වෙනස් මුහුණුවරක් ගෙන ඇත.
* ජාතක කතා සිතුවම් සම්ප්‍රදාය වෙනුවට බුද්ධ ශාසනයේ ඓතිහාසික සිදුවීම් ඇඳීම.
* කැළණි විහාරයේ සිතුවම් තේමා දෙකක් යටතේ ඇඳ තිබීම.
* බුද්ධ චරිතයේ අවස්ථා දැක්වීම හා ශ්‍රී ලාංකීය ඓතිහාසික සිද්ධි වශයෙනි.
* බෙල්ලන්විල පුරාණ රාජ මහා විහාරයේ චිත්‍ර අඳීන ලද ශිල්පියා වූයේ සෝම බන්දු විද්‍යාපතිය.
* පෙර අපර දෙදිග චිත්‍ර කලා මගින් ශ්‍රී ලංකේය නව විහාර සිතුවම් කලාවක් බිහිවිය.
* බෙල්ලන්විල විහාරයේ චිත්‍ර ඇඳ ඇත්තේ තෙල් සායම් වලිනි.
* වස්තු විෂය වූයේ සිදුහත් චරිතය, බුද්ධත්වය, බුදුන් සම්බන්ධ සිදුවීම් ආදියයි.
* බෙල්ලන්විල සිතුවම් නිර්මාණය සඳහා දකුණු ආසියානු සම්ප්‍රදායික සම්භාව්‍ය චිත්‍ර කලා ලක්ෂණ හා යුරෝපීය කලාවේ විශේෂිත කලාත්මක ප්‍රයෝග උපයෝගී කර ගෙන ඇත.
* කැළණි විහාරයේ නූතන චිත්‍රවල මෙන්ම බෙල්ලන්විල සිතුවම් වල ද රිද්මයානුකූල දිගටි රූප භාවිතය ඇත.


**මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.**

* කැළණි විහාර සිතුවම් විශාල අවකාශයක් මත ක්‍රියාකාරී රූප බොහෝ ගණනක් එකට සම්පිණ්ඩනය කර ඇඳ තිබීම සුවිශේෂ ලක්ෂණයකි. බෙල්ලන්විල විහාර චිත්‍රවල මානව රූප සම්පිණ්ඩනය අවකාශය පුරා කර ඇතත් කැළණි විහාරයේ තරම්ම නැත.
* බෙල්ලන්විල විහාරයට වඩා කැළණි විහාරයේ මානව රූ ක්‍රියාකාරී බවින් උසස්ය. බුදුන් වහන්සේ මහියංගනයට වැඩීම නම් සිතුවමේ මානව රූප අතිශය ක්‍රියාකාරීය. මුහුණුවල හැඟීම් ප්‍රකාශන ප්‍රබලය.
* ශ්‍රී පාද ලාංඡනය පිහිටුවීම නම් සිතුවමෙහි මානව දේහයේ සුන්දර වූ රිද්මය රේඛාවේ රිද්මය සමඟ ගලපා ඇති අයුරු මනරම්ය. ස්වාභාවිකය.
* බෙල්ලන්විල විහාර සිතුවම් මානව රුවේ රිද්මය සම්ප්‍රදායානුකූල වූ රේඛාව භාවිතයෙන් කර ඇත.
* චිත්‍ර සම්පිණ්ඩනයේ දී කැළණි චිත්‍ර වල රේඛාවට හිමි වන තැන සුවිශේෂ ය. ඉතා සියුම් නොකැඩුණු, ශක්තිමත් හා ලාලිත්‍යයෙන් යුතු රේඛාකරණයක් දැකිය හැක. සුදු පැහැති රේඛාකරණයක් දැකිය හැක. සුදු පැහැති රේඛාකරණය ප්‍රබලය.
* බෙල්ලන්විල විහාර සිතුවම්හි රේඛාවෙන් කෙරෙන ප්‍රබල ප්‍රකාශනය අඩුය. රේඛාවට කොතරම් ප්‍රාතිහාර්යයක් පෙන්විය හැකිද යන්න සෝලියස් මෙන්ඩිස් ශිල්පියා පෙන්වා ඇති ආකාරයත් සෝම බන්දු විද්‍යාපතිගෙග් රේඛාවේ සුලලිත බවක් විශ්මයජනකය.
* කැළණිචිත්‍රවල වර්ණ මාලාව ත්‍රිමාණ ලක්‍ෂණ සහිතව, කියරොස්කුරෝ සිද්ධාන්තයට සමානව භාවිතා කර ඇත. බෙල්ලන්විල සිතුවම්වල ඇසට ප්‍රිය සම්භාව්‍ය වර්ණ මාලාවක් භාවිතා කර ඇත. බෙල්ලන්විල විහාරයෙහි වර්ණ මාලාව නිසා චිත්‍රයට පැහැදිලි දීප්තියක් එක් වී ඇත. කැළණි චිත්‍රවල වර්ණයන්හි අඳුරු බව වැඩි අවස්ථා ඇත. එහෙත් ස්වාභාවිකත්වය සමඟ මුසු වූ හැඩතල වල විශිෂ්ටත්වය ප්‍රබලය.
* කැළණි චිත්‍රවල අවකාශයේ ඇති පිරුණු ස්වාභාවය බෙල්ලන්විල සිතුවම් වල නොමැත. කැළණි චිත්‍ර වල ඇති ජනාකීර්ණ බවෙන් තොරව, බෙල්ලන්විල සිතුවම් පැහැදිලි බවක් ඇති අතර සරලව නිදහසේ රස විඳිය හැකිය.
* විහාර දෙකෙහිම අඛණ්ඩ කථන ක්‍රමය බැහැර කර ඇත. අවකාශය විශාලය තීරු චිත්‍ර නැත.
* සමාන අසමානතා කොපමණ වුවත් දෙපැත්තෙහිම සිතුවම් වල කලා ලක්ෂණ ශිල්පීය කුසලතා අති විශිෂ්ටය.

02. (i) ඝණ්ඨාකාර, බුබ්බුලාකාර

(ii) ක්‍රි.පූ.3 වන සියවසට අයත් ථූපාරාම ස්තූපය දේවානම්පියතිස්ස රජු විසින් කරවා ඇත.
* බුදුන්වහන්සේගේ දකුණු අකු ධාතුව නිදන් කර ඇතැයි සැලකේ.
* අටමස්ථාන අතර වැදගත් පූජනීය ස්ථානයකි.
* විවිධ කාල වකවානුවල රජ කළ රජවරුන් විසින්, ප්‍රතිසංස්කරණ කටයුතු කර ඇත.
* මුල් යුගයේ ධාන්‍යාකාර වුවත්, වර්තමානයේ ඝණ්ඨාකාරය.
* කවාකාර වේදිකාවක් මත පොළව මට්ටමෙන් අඩි 11.4 ක් උසින් පිහිටුවා ඇත. විෂ්කම්භය අඩි 50ක් පමණය. උස අඩි 64 ක් පමණය.
*චෛත්‍යය වටා වටදාගෙයක් තිබූ බවට ඉතිරිව ඇති ගල්කණු සාක්ෂි දරයි.

(iii)* අනුරාධපුර යුගයේදී (ක්‍රි.ව.01 සියවසේ පමණ) ශ්‍රී ලංකීය ස්තූපයට එක් වූ නවතම නිර්මාණ අංගයකි.
* ස්තූපයක පේසා වළලු වලට යාබදව සතර දිසාවට මුහුණලා ඉදිකර ඇති මෙය ශිලා ලේඛනවල ආයික ලෙස හැඳින්වේ.
* අනුරාධපුර රුවන්වැලි සෑය, මිරිසවැටිය, අභයගිරිය, ජේතවන දාගැබ, මිහින්තලයේ කණ්ඨක චෛත්‍ය ආදී විශාල ස්ථූප වල වාහල්කඩ නිර්මාණය කර ඇත.
* වාහල්කඩේ සම්පූර්ණ පළලින් $\frac{1}{3}$ ක ප්‍රමාණයෙන් යුක්ත මැද කොටස ඉදිරියට නෙරා ආ විලසකට නිර්මාණය කර ඇත.
* අනුරාධපුර යුගයේ දී කැටයම් සහිත පහළ කොටස හුණු වලින් සහ ගලින්ද, ඉහළ කොටස ගඩොලින්ද නිර්මාණය කර ඇත.
* මෙහි ආකෘතික වශයෙන් පාදම සිට ඉහළට තිරස් අතට කැටයම් සහිත බොරදම් තීරු දක්නට ඇත.
* ගඩොල් වලින් නිම කරන ලද ඉහළ කොටස විමාන 03කි. මධ්‍යයේ වූ විමානය විශාලය. දෙපස විමාන කුඩාය.
* පහළ කොටසෙහි බොරදම් කැටයම් තීරු ස්තූපයේ පහළ පේසාවේ ඉහළ සිට ආරම්භ වී ඇත. වාහල්කඩ දෙපස, සිරස්ව විහිදුණු කැටයම් සහිත උස් වූ ගල් කණු දෙකක් දක්නට ඇත.
* වාහල්කඩ නිර්මාණ අතර, කලාත්මක වශයෙන් උසස් නිමවුමක් ලෙස මිහින්තලය කණ්ඨක චෛත්‍යයේ වාහල්කඩ සැලකේ. එහි කැටයම් මෙන්ම, සිතුවම් වලින්ද අලංකාරකර තිබූ බව ශේෂයන්ගෙන් පෙනේ.
* තිරස් පුවරුවල කැටයම් අතර, බොරදම්, මකර හිස් හා ඇත් හිස් මුහුණු හංස රූප සහ ගණ රූප පේලි තිබී ඇත.
* වාහල්කඩ දෙපස සිරස් ගල් කණු 2 කි. විශාල ගල් කණුවේ ඉදිරිපස පුන්කලස් සහිත කල්ප වෘක්ෂය සහ ජීවන වෘක්ෂය කැටයම් කර ඇත. කල්ප වෘක්ෂය පුන් කලසින් පටන් ගෙන ඉහළට විහිදෙන ලියවැලක් ලෙස දක්වා ඇත. එහි මිනිස්, සිංහ, ගව, කුරුලු ආදී රූප සමඟ මිශ්‍රව කැටයම් කර ඇත.
* කුඩා කුලුණුවල නාගරූප කැටයම්ද ඇත. කල්ප වෘක්ෂය කෙළවර ත්‍රි රත්නයේ ලාංඡනය දැක්වේ. ස්තම්භ ශීර්ෂ මත ගලින් ගල ඇත්, අශ්ව, ගව, සිංහ රූප 4 කි. ඉන් සිවු දිශාව නිරූපණය වන බව අදහසයි.


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

03. (i) නිශ්ශංකලතා මණ්ඩපය, අටදාගෙය, හැටදාගෙය, ථූපාරාමය, වටදාගෙය, තිවංක පිළිමගෙය

(ii) ගෙඩිගෙය වර්ගයට අයත් ප්‍රතිමාඝර ගඩොලින් හෝ කළු ගලින් හෝ නිම කර ඇත.

* ක්‍රි.ව. 8-10 සියවසට අයත්, මෙම වර්ගයට අයත් පිළිමගෙයක් ලෙස නාලන්දා ගෙඩි ගෙය හැඳීන්විය හැක.
* පොළොන්නරු යුගයේ මෙම සම්ප්‍රදායට අයත් ගොඩනැගිලි නම් ථූපාරාමය, ලංකාතිලක හා තිවංක පිළිමගෙය දැක්විය හැක.
* පොළොන්නරු යුගයේ විශේෂ ලක්‍ෂණයකි. ගර්භ ගෘහය වටා ප්‍රදක්ෂිණාපථයක් ඇතිවීම.
* ගම්පල යුගයේ හා මහනුවර අවධි වලදී ගෙඩිගේ සම්ප්‍රදාය තිබූ බවට ගඩලාදෙණි විහාරය නිදසුන් සපයයි.
* ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමාඝර, චෝල, හින්දු ප්‍රථිමාඝර ලක්ෂණ වලින් සමන්විත විය.
* ගර්භගෘහය, අන්තරාලය, මණ්ඩපය හා ද්වාර මණ්ඩලය යන කොටස් වලින් සමන්විතය.
* නැගෙනහිරින් ප්‍රධාන දොරටුවයි. දෙවන දොරටුව උතුරිනි.
* ගර්භය මස්තකයේ චෛත්‍යාකාර හැඩයෙන් යුත් ශිඛරයකි.
* මුළු ගොඩනැගිල්ල වහලයක් සමඟ ගඩොල් වලින් තැනූ අවස්ථා ඇත.
* පාදම, දොර උළුවහු, ජනෙල් උළුවහු හා පියගැට පෙළ සංකීර්ණය ගලින් තනා ඇත. පාදම ද්විත්වය, බිත්ති ඝනකම්ය.
* පිටතින් නරඹන විට, එය මහල් ගෙයක් වශයෙන් පෙනෙන තරමට උසින් යුක්තය.
* අනුරාධපුර යුගයට වඩා පොළොන්නරු යුගයේ පිළිමගෙවල් විශාලය.

(iii) * පොළොන්නරු පරාක්‍රමබාහු රජුගේ මාලිගය, ශ්‍රී ලංකාවේ පුරාණරාජ මාළිගා අතරින්,ඉතා රමණීය වූවකි. වෛජයන්ති ප්‍රාසාදය ලෙස ද හඳුනාගෙන ඇත.

* චූල වංශයට අනුව, කුටි දහසකින් යුක්ත සත්මහල් ප්‍රාසාදයක් යයි අදහසකි.
* ගලින් හා ගඩොලින් ඉදි කළ මහල් ගොඩනැගිල්ලකි. පියගැට පෙළ ශේෂව ඇත. වර්තමානයේ ද මහල් තුනක ශේෂ දැකිය හැක.
* ගඩොල් බිත්ති වලට ශක්තිය ලබා දීමට, දැව කණු ගිල්වා තිබූ අතර, මාලිගා මධ්‍යයේ වූ බිත්තිවල ඝණකම අඩි 10 කි. ශේෂව ඇති සමහර බිත්ති වල උස අඩි 30කි.
* ශාලාවේ අති විශාල වහලය දරා සිටීමට කුලුණු 36 කි. ප්‍රධන ශාලාව හැරුණු විට අනෙකුත් කාමර වට කොට පේළි දෙකක් හෝ තුනක් හෝ වශයෙන් සකසන ලද පනහකට අධික ප්‍රමාණයක කුටි පෙළක් බිම් මහලේ දක්නට ඇත.
* ප්‍රධාන මාලිගය ඇතුලු ගොඩනැගිලි සංකීර්ණය තුළ පිටත ප්‍රාකාරය, බිම් මහලේ කාමර, රාජ සභාව, මගුල් මඩුව, පියගැට පෙළ ඇතුළු ශාලාව යන කොටස් හඳුනාගත හැකි පරිදි ශේෂව ඇත. මෙම ශේෂ අතර, ඇමතිවරුන්, ආරක්‍ෂක නිලධාරීන් සහ මෙහෙකරුවන් උදෙසා නිම කරන්නට ඇතැයි සැලකිය හැකි නිවාස වූ බවද අනුමාන කරයි.
* මෙම මාළිගය නිම කිරීමට ගත් ප්‍රධාන ද්‍රව්‍ය ගඩොල්ය. උපරි භාගය හා වහල දැව භාවිතයෙන් කරන්නට ඇතැයි අනුමාන කෙරේ. වහල උළු සෙවිලි කර තිබූ බවට අනුමාන කෙරේ.

04. (i) 1. පිහිටි ගල් ඇතුලට හාරා සහ නෙලන ලද දේවාල (Rock cut and carved temple)

2. ව්‍යුහාත්මක දේවාල (Structural temple)

(ii) ධර්ම රාජ රථය, පංච පාණ්ඩව රථ සංකීර්ණය තුළ තිබෙන උසම ගොඩනැගිල්ලකි.

* මෙම දේවාලය ද නිර්මාණය අතින් අසම්පූර්ණය.
* පළමුවන නරසිම්හවර්මන් රාජසිංහ අවදියේ ඉදි කරන ලද්දකි.
* අර්ජුන රථය හා සමාන නමුත්, ඊට වඩා විශාලය. සැරසිලි සහිත අංග වලින් යුක්තය.
* තැනූ අවධියේ දකුණු ඉන්දියානු වාස්තු විද්‍යාවේ පූර්ව සංවර්ධනාත්මක ශෛලිය ලක්‍ෂණ පෙන්වයි.
* මෙම දේවාලය තුල සෝමස්කන්ධය මූර්තිමත් කර ඇත.
* මෙම සෝමස්කන්ධ කැටයමට දෙපසින් විෂ්ණු සහ බ්‍රහ්ම රූප නෙළා ඇත.

(iii) * පල්ලව අවධියේ ගොඩ නගන ලද ඉතාම සිත් කලු කලා කෘතියකි.

* පළමුවැනි මහේන්ද්‍ර වර්මන් ගේ තාලයට හෝ ඔහුගේ පුත් මාමල්ල ගේ කාලයට අයත් යැයි විශ්වාස කෙරේ.
* මෙම ආකර්ශනීය කැටයම ආකාශ ගංගාව රෝහණය ලෙස හෝ අර්ජුනගේ තපස ලෙස හෝ හඳුනාගෙන ඇත.
* මීටර් 15 ක් පමණ උසින් සහ මීටර් 30ක් පමණ දිගින් යුක්ත ගල් කැටයමකි.
* ඒ තුළ මානව රූප විශාල ප්‍රමාණයක් හා සතුන් සහ වෙනත් නිරූපණ අන්තර්ගත ඇත. මේවා බොහෝ දුරට ජීව ප්‍රමාණයෙන් නෙළා ඇත.
* මෙම විශාල සංරචනයේ ප්‍රධාන ම සහ අර්ථාන්විතම භාවිතය නම් ගල මැදින් ඇති ස්වාභාවික විවරය, වාස්තු විෂයට හා සැලසුමට ඉතා උචිත ලෙස සම්බන්ධ කර ගැනීමය.
* ස්වාභාවික ගල් විවරයේ ඉහළ සිට පහළට නෙළා තිබෙන නාග රූප මඟින් ශුද්ධ ජලය පිළිබඳ අදහසක් ප්‍රකාශ වේ.
* මෙම කලා නිර්මාණයේ ඉහළම කොටස තුළ ඇති මානව රූ සැහැල්ලුවෙන් පාවෙන ඉරියව්වකින් යුක්තය.
* විශාල ප්‍රමාණයේ ඇතුන් දෙදෙනාගේ ස්වාභාවික ඉරියව් දැක්වීම ඉතා විශිෂ්ටය. ස්වාභාවික වාදී ශෛලියට අනුවම නෙලා ඇත. මෙය පල්ලව කලාවේ ලක්ෂණයකි.
* දෙවියකු සහිත කුඩා දේවස්ථානයක් ද ඇත.
* නිරූපණාත්මක කතාන්දර කීමේ අදහසින් නිම කර ඇත.


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

05. (i) ෂද්දන්ත ජාතකය, මහා කපි ජාතකය, හංස ජාතකය, වෙස්සන්තර ජාතකය, මාතුපෝෂක ජාතකය.

(ii) ඉන්දීය කලාවේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන ගුප්ත යුගයේදී ඉදි වූ අජන්තා ලෙන් මගින් වාස්තු විද්‍යාවේ විශිෂ්ට ලක්‍ෂණ පෙන්වන බව විචාරක මතයයි.

- සුවිසල් කඳු පර්වතය ඇතුලට හාරා ඒ තුළ විශිෂ්ට ප්‍රතිමා, චෛත්‍ය, ගල් කඳු නිර්මාණය කිරීම මගින් ශිල්පීය පරිණත ලක්‍ෂණ පෙන්වයි.
- අජන්තාව ලෙන් 30 කින් සමන්විතය. සියල්ල බුදු සමය හා සම්බන්ධ වේ.
- අංක 27 සිට 30 දක්වා ලෙන් නිම නොවූ ඒවාය.
- යාර 600ක පමණ දිගින් ද, අඩි 250ක් පමණ වූ උසකින් ද හෙබි අජන්තා ලෙන් චෛත්‍ය ශාලා හා විහාර ශාලා ලෙන් වෙන් කර දක්වා ඇත.
- අංක 1, 2, 16, 17 යන ගුහා වල අලංකාර සිතුවම් සහිතය.
- අංක 9, 10, 16, 19 ලෙන් චෛත්‍යශාලා ලෙසට හඳුනාගෙන ඇත.
- චෛත්‍ය ශාලාවල කෙළවර කුඩා ස්ථූප දක්නට ලැබේ.
- 28 වන ගුහාවද නිම නොකළ එකකි.
- අංක 10 ගුහාව පැරනිම ලෙන ලෙස සැලකේ. ක්‍රි.පූ. 2 සියවසේ ඉදි කර ඇත. දිග අඩි 95 $\frac{1}{2}$ කි. පළල අඩි 41 කි. උස අඩි 36 කි.
- ලෙන් නිම වී ඇත්තේ එකිනෙකට වෙනස් සැලසුම් සහිතවය.

(iii) අජන්තාවේ වැදගත්ම කලා අංගය එහි ඇති සිතුවම් ය. ඒ අතර ජාතක කථා, බුද්ධ චරිතයේ වැදගත් සිදුවීම් මෙන්ම ඓතිහාසික සිද්ධීන් ද වේ. සියවස් ගණනක් විවිධ කාලගුණ තත්වයන්ට ඔරොත්තු දෙමින් ඉතිරිව ඇති සිතුවම් සමූහය එකල ශිල්පියාගේ දක්ෂතාව මනාව පෙන්නුම් කරයි.

- පැරණිම සිතුවම ඇති ලෙන් ලෙසට අංක 9 හා 10 ගුහා හඳුනාගෙන ඇත.
- එමෙන්ම ස්තර කීපයක සිතුවම් හමුවීමෙන් පෙනී යන්නේ කලින් කල විවිධ වෙනස්වීම් මැද සිතුවම් නිර්මාණය වී ඇති බවයි.
- අංක 16, 17 ලෙන් තුළ ඉතා විශිෂ්ට සිතුවම් දැකිය හැක.
- මෙම සිතුවම් අතර, බොහෝ විමසුමට ලක්ව ඇති අංක 01 ලෙනේ, පද්මාණි බෝධිසත්ව චිත්‍රය හැඳින්විය හැක. මුහුණේ ඇති කාරුණික බව මැනවින් පෙන්වා ඇත. අතේ නිල් මානෙල් මලකි. අනෙක් රූප වලට වඩා විශාලව මෙම රුව ඇඳ ඇත. මුහුණේ ඇති ශෝකාකුල බව, ශාන්ත බව මැනවින් පෙන්වා ඇත. පසුබිමෙහි කාන්තා රූ, පිරිමි රූ, පක්ෂි රූ, වඳුරු රූප ඇඳ ඇත. කර්ණ හා ග්‍රීවාභරණ රුවට අලංකාරයක් එක් කරයි. මානව දේහ නිර්මාණය පිළිබඳ ඉතා විශිෂ්ට උදාහරණයකි.
- ත්‍රිභංග ඉරියව්වක් සහිතය. අඳුරු කොළ පැහැය, රත් පැහැය මෙන්ම නිල් පැහැය ද සිතුවමේ අලංකාරය තිව්‍ර කරයි. වියළි බදාමය මත ඇඳ ඇත.
- බුදුන් වහන්සේ කිඹුල්වත්පුර වැඩීම සිතුවම පරිමාණ පිළිබඳ නොසලකා අඳින ලද චිත්‍රයකි. බුදුරජාණන් වහන්සේගේ රූප කාය අඩි 12 ක් පමණ උසට නිර්මාණය කර ඇත. චිත්‍ර ශිල්පියා රජ මාලිගය ඇතින් ඇති අකාරයට පර්යාලෝක ලක්ෂණ සහිතව ඇඳ ඇත. සඳලුතලයේ සිටින යශෝදරා දේවිය රාහුල කුමරු හට තම පියා පෙන්වන අවස්ථාව මින් නිරූපිත බව විචාරක මතයයි. හැඟීම් ප්‍රකාශනය අතින් මෙම සිතුවම වැදගත් තැනක් ගනී. රඹ, ලා කොළ, දුඹුරු වර්ණය, කහ වර්ණය මෙන්ම සුදු වර්ණය ද සිතුවම සඳහා යොදා ගෙන ඇත.
- අප්සරා රූ ද 17 ගුහාවේ දැකිය හැක. මෙම රූපවල හිස් මලින් සැරසීම, මුතු පොටවලින් සැරසීම සීගිරි අප්සරා රූ සිහි ගන්වයි. අඩවන් දෙනෙත් සහිත හැඟීම් බර මුහුණු නිරූපිතය.
- කුලුනකට හේත්තුව සිටින කුමරිය, මියයන කුමරිය, සීහලාවදානය යන සිතුවම් ද අලංකාරය. ඉතා පැහැදිලි, දීප්තිමත් සිතුවම් කීපයක් ද ඇත.

06. (i) නිල් පුටුව මත ගැහැණු ළමයා, ස්නානය, හිසකෙස් සකසන ගැහැණු ළමයා

(ii)

- ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී වර්ණයන්ගේ මධ්‍යම පැහැ ගොඩ නැගීම මගින් වස්තුවල ත්‍රිමාණ බව මතු කිරීමේ තාක්ෂණික ක්‍රමය අත් හැරීම හා අලංකාරවාදී වර්ණ රටාවෙන් මිදී දීප්තිමත් පිරිසිදු වර්ණ භවිතා කිරීම.
- චිත්‍රාගාර තුළ සිට චිත්‍ර ඇඳීමේ සහ වර්ණ කිරීමෙන් මිදුණු උපස්ථිතිවාදීන් ස්වාභාවික ආලෝකයේ පරිවර්තන හමුවේ ස්වාභාවයෙන් ඇතිවන ආලෝක තත්ව වර්ණ භාවිතයෙන් තේරුම් ගැනීමට උත්සාහ කිරීම.
- නුමුහුන් පිරිසිදු වර්ණ නිදහස් පින්සල හැසිරවීම හරහා කැන්වසගේ තැවරීම.
- ස්වාභාවික ආලෝකයේ ක්‍ෂණික වෙනස්වීම පින්තාරු කිරීමට තද ඇල්මක් දැක්වීම.
- අවිධිමත් ලෙස සංරචනය සිදු කිරීම.

(iii) ප්‍රංශ ජාතික උපස්ථිතිවාදි සිත්තරෙකි. ඔහුගේ ''හිරු නැගීම'' චිත්‍රය හේතු කොට ගෙන ඔහු ඇතුළු කණ්ඩායම උපස්ථිතිවාදීන් ලෙස නම් කර ඇත.

- මොහුගේ ශෛලීය ලක්‍ෂණ වන්නේ පැහැදිලි හැඩ විස්තර කිරීමෙන් හා රේඛීය පර්යාලෝකයෙන් මිදී නිදහස පින්සල් පහරවලින් අමිශ්‍ර වර්ණ පදාස සහිතව සම්භාව්‍ය ශාස්ත්‍රාලයීය සම්මතයන්ට එරෙහිව කටයුතු කිරීමය.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

* එළිමහන් භූමි දර්ශන එකම ආකාරයකට පැවතිය නොහැකි බවත්, එහි පෙනී සිටීම සෑම මොහොතකම වෙනස් වන බවත්අවධාරණය කරයි.
* හිරු නැගීම කැන්වසය මත තෙල් සායමින් නිම කරන ලද චිත්‍රයකි.
* පුනරුදයේ සිට යුරෝපීය චිත්‍ර කලාව තුල වර්ධනය වූ විධිමත් චිත්‍රමය ආකෘතිය බණ්ඩනය කර ඇත.
* ඉතාම කෙටි කාලයක් තුල ස්වාභාවික ආලෝකයේ ඇති විය හැකි අවිනිශ්චිත ස්වාභාවය ''හිරු නැගීම'' චිත්‍රයෙන් ඒත්තු ගන්වා ඇත.
* ප්‍රංශයේ ල හාවේ වරායේ එක් නිමේෂයක් තුල පවතින ස්වාභාවික ආලෝකය පිළිබඳවයි. මෙයට කාලය හා වේගය මැදිහත්ව චිත්‍රයේ විධිමත් සංරචනය බණ්ඩනය කරන බව පවසයි. මෙය යුරෝපා චිත්‍ර කලාවේ තවත් ආකෘතිකමය පෙරළියකි. මෙම පෙරළිය 20 වන සියවසේ ගොඩනැගුණු නූතන කලා ක්ෂේත්‍රය වර්ධනයට ඉවහල් විය.
* මෙම චිත්‍රයෙන් නව සම්භාව්‍යවාදී සහ අලංකරවාදී කලා ප්‍රවණතාවලින් ඇති කරන ලද නව තේමාත්මක වෙනස තවදුරටත් වර්ධනය කරමින් සම්ප්‍රදායික ආකෘතියෙන් හා අන්තර්ගතවලින් සපුරා ඉවත් විම මින් සිදුවේ. ශිල්පියා බලාපොරොත්තු වූ වෙනස හෝ පෙරළිය මින් සිදුවී ඇතැයි සඳහන් කළ හැකිය.
* මොහුගේ චිත්‍ර කලා ප්‍රයෝග අතර ප්‍රධාන ලක්ෂණය චිත්‍රමය පෘෂ්ටය මත වර්ණමය කොටස්වලට හෝ වර්ණමය ඒකකවලට පත් කිරීමයි. මොනේ ගේ වර්ණ අප දන්නා වර්ණ නොවේ. ඒවා අපිට දකින්නට සලස්වන ලද වර්ණය මෙම කලාත්මක ප්‍රයෝගය ඉතා හොඳින් සහ නාට්‍යානුසාරී ලෙස ඉදිරිපත්ව ඇති චිත්‍රයක් ලෙස රොවුන් දේවස්ථානය නම් සිතුවම් පෙළ දැක්විය හැකිය. දේවස්ථානය සූර්යාලෝකයෙන් නැහැවෙන විට වර්ණයන්හි පවතින නොපැහැදිලි බව ඒ අයුරින්ම ග්‍රහණය කිරීමට මොනේ වෙහෙසී ඇත.
* ''ලිලී මල් සහ ජපන් පාලම'' කෘතිය කැන්වසය මත තෙල් සායමික් කර ඇත. මෙම චිත්‍රය මගින් මොනේ උත්සාහ ගෙන ඇතතේ වායුගෝලය තුල ඇති නාට්‍යානුසාරී ස්වාභාවය සහ වස්තු මත ආලෝකය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ පිටපතක් කැන්වසය මත ගොඩ නැගිමයි. වස්තුවක් සූර්යාලෝකයෙන් නැහැවෙන විට මූලික හැඩ සහ ඊට ආවේණික වර්ණ පදාස බවට පත් වේ. ඒ බව මෙම චිත්‍රයෙන් දක්වා ඇත.
* චිත්‍රය තව දුරටත් ඒ අයුරින්ම නිරූපණය කිරීමක්ය යන සම්ප්‍රදායික අදහස ඔහු අභියෝගයට ලක් කර ඇත. මෙම චිත්‍රය මගින් ප්‍රකාශ කරන්නේ චිත්‍රය යනු වර්ණමය ප්‍රකාශයක්ය යන්නයි. නූතන චිත්‍ර කලා අධ්‍යනයේදී මෙය වැදගත් වේ.

07. (i) ඉක්ටින්ස්, කැලික්‍රටිස්

(ii) ග්‍රීක මැටි බඳුන් විවිධ කාර්යයන්ට ගැළපෙන පරිදි විවිධ හැඩයන්ගෙන් විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්තව නිර්මාණය වූවකි. විවිධ කාර්ය හා ඒ සඳහා දෙනු ලැබූ ආකෘතිය, හැඩය අනුව විවිධ නම් වලින් හැඳින්විණි. වයින් දැමීමට උස බඳුන්ය. ඒවා ඇම්පොරාය. ජලය රැස් කර තබා ගැනිම සඳහා භාවිතා කළේ හයිඩ්‍රියාය. කන්නාරෝස්, කයිලිකස්, ලෙකිනොස් යනුවෙන් තවත් මැටි බඳුන් වර්ගය.

මැටි බඳුන් වල විසිතුරු සැරසිලි මෝස්තර යොදා අලංකරණය කර තිබී ඇත. උපයෝගීතාව අගයෙන් මෙන්ම කලාත්මක අතින් ද උසස් මට්ටමක ඇත. මුල් කාලයේදී ජ්‍යාමිතික හැඩතල සහිත මොස්තර රටා බහුලව යොදා ඇත. ක්‍රි.පූ. 800 පමණ වන විට මැටි බඳුන් මෝස්තර කලාව පරිණත අවධියකට එළඹ ඇත.

(iii) ග්‍රීසියේ මූර්ති කලාව ඉතා කෙටි කලක් ඇතුළත දියුණුවට පත් වන විට මූර්ති ශිල්පීහු විවිධ ඉරියවුවලින් යුක්ත ක්‍රියාකාරී මානව රූප නිර්මාණය කළහ.

ක්‍රි.පූ. 480 වන විට පෞරාණික අවධිවල කිබූ ක්‍රම, ඉරියව් බැහැර කර ඉතා රිද්මයානුකූල සැහැල්ලු ඉරියව් හඳුන්වාදී ඇත. ශරීරයේ මධ්‍ය රේඛාව "S" හැඩය අනුව ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රමය හඳුන්වා දී ඒ අනුව ශරීර ආකෘතිය සකස් කර ඇත.

* ග්‍රීක ශිල්පීහු පණ ඇති සාමාන්‍ය මිනිස් රූ තම ආදර්ශ රූප ලෙස ගෙන ඇත.
* පරිපූර්ණ සුන්දරත්වය හා කඩවසම් බව මෙම නිර්මාණ වලින් පිළිඹිබු කර ඇත. මෙම ලක්ෂණ සම්භාව්‍ය ලක්ෂණ සේ සැලකේ.
* ග්‍රීක ප්‍රතිමා කලාවේදී දේව සංකල්ප මනුෂ්‍ය රූපාකාරයෙන් දැක්වීම සුවිශේෂය සියුස්, ඇතීනා, වීනස් යන නිර්මාණ උදාහරණ වේ. සම්භාව්‍ය අවධියට අයත් නිර්මාණ, තාරුණ්‍යය පිළිඹිබු කරන ඉරියව්වලින් සමන්විතය.
* සෑම අංගයකින් ම පරිපූර්ණ නිර්මාණ කලහ. පළමු වරට නිර්මාණ ශිල්පීන්ගේ නම් සහිතව නිර්මාණ කළහ. පීඩියස්, මයිරන් හා ප්‍රැක්සිටෙලස් ද පොලික්ලීටස් ද ඉතා වැදගත් වේ. මෙම අවධියේ දී මූර්ති නිර්මාණ සඳහා කිරි ගරුඬ හා ලෝකඩ මාධ්‍යය ද භාවිතා කරන ලදී.
* මයිරන්ගේ කවපෙත්ත විසි කරන්නා මූර්තියේ සැබෑ ක්‍රීඩකයකු ගේ ක්‍රීඩා ඉරියව්ව විශිෂ්ටව නිම කර ඇත. මානව රුවේ සමබරතාව පිළිබඳ හොඳම අධ්‍යයනයකි.
* ' හර්මිස් හා ඩයොනීසස් ' නමැති මූර්ති ප්‍රැක්සිටෙලස් ශිල්පියා විසින් කරන ලද නිර්මාණයකි. ජීව ප්‍රමාණයෙන් යුත් කිරි ගරුඬ පූර්ණ උන්නත මූර්තියකි.
* පුරුෂ ශරීරයක මාංශ පේශි වල ස්වභාවය හා පෞරුෂ ලක්ෂණ මෙමගින් මනාව නිරූපණය කර ඇත. පහළට එල්ලා වැටෙන වස්ත්‍රය ස්වාභාවික ලෙස නිරූපණය කර ඇත. එය සිරුර සැහැල්ලුවෙන් හා නම්‍යශීලී ඉරියව්වෙන් තබා ගැනීමට ආධාරකයක් ලෙස නම්‍යශීලීව නිරූපණය කර ඇත.


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

* ඩොරිපෝරස් නම් වූ හෙල්ල දරන්නා ලෝකඩ මූර්තිය පොලික්ලීටස් ශිල්පියාගේ ය. ඕනෑම පැත්තකින් බැලූ විට මූර්තියේ ලාලිත්‍ය ලක්ෂණ හොඳින් දැකිය හැකි ඉතා සමබරව නිර්මාණය කර ඇති කඩවසම් පුරුෂ රුවකි. නිවැරදි පරිමාණානුකූලව නිම කර ඇත. නිරුවත් සිරුරේ මස් පිඩු ඉතා ස්වභාවිකව දැක්වේ.

## පළමු වාර පරීක්ෂණය - 2020 - 13 ශ්‍රේණිය

## චිත්‍ර කලාව II - ලකුණු දීමේ නිර්ණායක
## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

අභිමාතාර්ථ

1. ස්වභාවික හා නිර්මිත වස්තූන්ගේ ස්වභාවය හා හැඩය තේරුම් ගැනීමේ හැකියාව හා සිද්ධාන්ත භාවිතය පිළිබඳ කුසලතාව හා ක්‍රම ශිල්ප භාවිතය මැන බැලීම.
2. රේඛා මාධ්‍ය භාවිතයෙන් වස්තූන් ගේ ගති ලක්ෂණ නිරූපණය වනසේ ප්‍රකාශ කිරීමේ හැකියාව හා සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මැන බැලීම.
3. වර්ණ භාවිතා කිරීමේ ක්‍රම ශිල්ප හා වස්තූන්ගේ ගති ලක්ෂණ මතුවන සේ වර්ණා භාවිතාය පිළිබඳ හැකියාව මැන බැලීම

II වන පත්‍රය සඳහා අපේක්ෂකයන් ඇඳ ඇත්තේ එක් වර්ණ චිත්‍රයක් පමණි. මෙයන් ද්‍රව්‍ය සමූහය ඇසුරින් යථාරූපී චිත්‍රයක් ඇඳ වර්ණ කර නිම කිරිම අපේක්ෂා කෙරේ. මේ සඳහා ලකුණු තීරණය කල යුතුවේ. එකිනෙක නිර්ණායකන් යටතේ තීරණයකට එළඹ ලකුණු තීරණය කළ මැනවි. මෙහිදී තම රුචිය අනුව චිත්‍රය ඇගයීමට භාජනය නොකළ යුතු අතර අපේක්ෂකයා ප්‍රදර්ශනය කර ඇති කුසලතා තේරුම් ගෙන එය පදනම් කරගෙන ඇගයීමෙ කල යුතුවේ.

ලකුණු දීමේ නිර්ණායක :-

| | |
|---|---|
| 01. ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත් ව සංරචනය කිරිමේ හැකියාව | (ල. 20) |
| 02. ද්‍රව්‍යයක්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව | (ල. 20) |
| 03. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාවලෝකය,ත්‍රිමාණ ලක්‍ෂණ, ඇස්මට්ටම, අවකාශ භාවිතය) | (ල. 20) |
| 04. වර්ණ භාවිතය හා ගති ලක්‍ෂණ දැක්වීම. | (ල. 20) |
| 05. චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ථ නිමාව | (ල. 20) |

II වන ප්‍රශ්න පත්‍රය සඳහා හිමිවන මුළු ලකුණු 100

---

## පළමු වාර පරීක්ෂණය - 2020 - 13 ශ්‍රේණිය
## චිත්‍ර කලාව III - ලකුණු දීමේ නිර්ණායක
## "අ" කොටස - චිත්‍ර සංරචනය

ලකුණු දීමේ පටිපාටිය:-

### III - පත්‍රය 'අ' චිත්‍ර සම්පිණ්ඩනය

1. තොරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත වාතාවරණය හා පරිසරය ප්‍රකාශ කර ඇති අයුරුව (ලකුණු 20)
2. රේඛා හැඩතල ඇසුරින් මානව රූ ඇතුළු සියලු හැඩතල තලය මත සම්පිණ්ඩනය කර ඇති අයුරුව(ලකුණු 20)
3. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පරිමාණ, පර්යාලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම හා අවකාශ භාවිතය (ලකුණු 20)
4. වර්ණ භාවිතයේ දක්වා ඇති කුසලතාව (ලකුණු 20)
5. අනුගමනය කර ඇති ශෛලීය හා සමස්ත නිමාව (ලකුණු 20)

(ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)

### III - පත්‍රය 'ආ' මෝස්තර හා සැරසිලි නිර්මාණය

| | |
|---|---|
| 1. මාතෘකාවට අදාල නිර්මාණ කාර්යයට උචිත අයුරින් | (ලකුණු 20) |
| 2. පාරිභාරික අවශ්‍යතාවයන්ට ගැලපෙන බව හා කර්මාන්තයට | (ලකුණු 20) |
| 3. රේඛා හැඩතල අර්ථවත්ව යොදා ගැනීමේ හැකියාව | (ලකුණු 20) |
| 4. උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව | (ලකුණු 20) |
| 5. විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | (ලකුණු 20) |

(ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)

### III - පත්‍රය 'ඉ' ග්‍රැෆික් නිර්මාණය

| | |
|---|---|
| 1. මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවයකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව | (ලකුණු 20) |
| 2. වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව. | (ලකුණු 20) |
| 3. රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව | (ලකුණු 20) |
| 4. උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව | (ලකුණු 20) |
| 5. විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | (ලකුණු 20) |

(ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

WWW.LOL.LK

# BUY

## PAST PAPERS

## 071 777 4440

Buy Online - www.LOL.lk

- GCE O/L
- GCE A/L
- PAST PAPERS
- SHORT NOTES



Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

LOL.lk
Learn Ordinary Level

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

**HUGE SALE – SHOP NOW**




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

- GCE O/L Exam




GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART





GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00




GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00




GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00